කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture
"ගොවිජන මන්දිරය", 80/5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
"கோவிஜன மந்திரய", 80/5, ரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
"Govijana Mandiraya", 80/5, Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NFS/FCG(OFC)/Circular - 2017 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.09.19 |

කොමසාරිස් ජනරාල්-ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ ජනරාල්-කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ ජනරාල්-මහවැලි සංවර්ධන අධිකාරිය,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,
සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,
ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරින්,

## අය - වැය යෝජනා ක්‍රියාත්මක කිරීම

## වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සඳහා පොහොර මුදල් සහනාධාර ලබා දීම - 2017

2016 අය-වැය යොජනා ක්‍රියාත්මක කිරීම යටතේ, 2017 වර්ෂයේ වෙනත් ක්ෂේත්‍ර බෝග (අර්තාපල්, ළූණු, මිරිස්, සෝයා හා බඩ ඉරිඟු) වගා කරන ගොවීන්ට පමණක් මෙම සහනාධාරය හිමි වේ.

2017 වර්ෂයේ වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා මුදල් සහනාධාර ලබාදීමේ දී අවධානය යොමු කළයුතු කරුණු හා උපදෙස් ඇතුළත් චක්‍රලේඛය මේ සමඟ අමුණා ඇත. එහි සඳහන් ක්‍රමවේදය, උපදෙස්, සීමාවන් හා කොන්දේසි මැනවින් අවබෝධ කරගෙන කටයුතු කරන ලෙසත් අදාළ පාර්ශවයන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලමි.

මේ පිළිබඳව ඔබ දක්වන සහයෝගය බෙහෙවින් අගය කරමි.

පී.එස්.කේ.ආර්.වීරකෝන්
ලේකම් (වැ.බ.)
කෘෂිකර්ම අමාත්‍යාංශය

| | | | | |
|---|---|---|---|---|
| ලේකම්<br>செயலாளர்<br>Secretary | දුරකථන தொலைபேசி Telephone - 2868920<br>ඊ - මේල් ஈமெயில் E- mail - sec.agri@yahoo.com<br>ෆැක්ස් தொலைநகல் Fax - 2863497 | කාර්යාලය<br>அலுவலகம<br>Office | දුරකථන தொலைபேசி Telephone - 2869553, 2888902, 2872097<br>ෆැක්ස් தொலைநகல் Fax - 2868910 | |

කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture
"ගොවිජන මන්දිරය", 80/5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
"கொவிஜன மந்திரய", 80/5, ராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
"Govijana Mandiraya", 80/5, Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. NFS/FCG(OFC)/Circular - 2017 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2017.09.19 |

කොමසාරිස් ජනරාල් (ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව)
අධ්‍යක්ෂ ජනරාල් (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)
අධ්‍යක්ෂ ජනරාල් (මහවැලි සංවර්ධන අධිකාරිය)
අධ්‍යක්ෂ ජනරාල් (කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය)
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක
දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ
ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය
සියලුම ගොවිජන සංවර්ධන නිලධාරීන්

## පොහොර සහනාධාර මුදල් ප්‍රදාන වැඩසටහන

## වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව වෙනුවෙන් පොහොර මිලදී ගැනීම සඳහා මුදල් සහනාධාර ලබාදීම - 2017

1. **වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සඳහා පොහොර මුදල් සහනාධාර ප්‍රතිපත්තිය**

1.1. ගොඩ ඉඩම්වල "අර්තාපල්, ළූණු, මිරිස්, සෝයා හෝ බඩ ඉරිඟු" යන බෝග අතුරින් එකක් හෝ කිහිපයක් පමණක් වගා කරන ගොවීන් හට මෙම මුදල් සහනාධාරය හිමි වේ.

1.2. සහනාධාර හිමිකම සඳහා ඉහත 1.1. හි සඳහන් බෝග එකක් හෝ කිහිපයක වගාව උපරිම හෙක්ටයාර් 01(අක්කර 2.5) ක සීමාව නොඉක්මවිය යුතු යි.

1.3. වසරකට හෙක්ටයාර් 1 (අක්කර 2.5) ක් සඳහා උපරිම මුදල් සහනාධාරය රු.10,000/- කි. (ඉඩමේ වගා වපසරිය අනුව හිමි වන සහනාධාර මුදල ඇමුණුම 1 හි සඳහන් වේ.)

1.4. 2017 වර්ෂයේ වී, තේ, පොල් හෝ රබර් වගාව සඳහා පොහොර මුදල් සහනාධාරය හිමි ගොවීන් ද වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා වන පොහොර මුදල් සහනාධාරයට හිමිකම් ලබයි.

1.5. වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා වන පොහොර මුදල් සහනාධාරය සඳහා වර්ෂයකට එක් වරක් පමණක් හිමිකම් ලබන බැවින්, 2017 වර්ෂය තුළ වගාව ආරම්භ කර ඇති ගොවීන් පමණක් වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සඳහා වන පොහොර මුදල් සහනාධාරය සඳහා සුදුසුකම් ලබයි.

1.6. මුදල් සහනාධාරය ලබා ගැනීම සඳහා ගොවීන්ගේ වගා ඉඩම් අදාළ ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන නිලධාරී විසින් ග්‍රාම නිලධාරී වසම් අනුව නිශ්චිතව හඳුනාගෙන තිබීම අනිවාර්ය වේ. එලෙස හඳුනාගත් ඉඩම්වල ලේඛනයක් සකස් කර එම ලේඛනයේ පිටපතක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස) / ග්‍රාම නිලධාරී කාර්යාල වල ප්‍රදර්ශනය කළ යුතුය.

1.7. මහවැලි කලාප වල ඉඩම් සම්බන්ධයෙන් මහවැලි කලාප කළමනාකරු විසින් ඉඩම් හඳුනාගැනීමේ ලේඛනයක් සකස් කර එය භාවිතා කළ යුතුය.

ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி Telephone - 2868920; ඊ - මේල් / ஈமெயில் E- mail - sec.agri@yahoo.com; ෆැක්ස් / தொலைநகல் Fax - 2863497
කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி Telephone - 2869553, 2888902, 2872097; ෆැක්ස් / தொலைநகல் Fax - 2868910